ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 මැයි 14 සඳුදා
04 වෙළුම - 29 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය





## නිමල මරිය නිකායේ නිර්මාතෘ මුනිතුමා
## ශූ. එව්ජින්ද මැසනොද්

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# එව්ජින්ද මැසනොද් තුමා නිර්මල මරිය නිකායේ ආරම්භක මුනිවරයායි.

## ආදරණීය දුවේ පුතේ...

මෙවර ''ළමා ප්‍රදීපය'' කවරයේ කථාව සරසන්නේ ශුද්ධවූ එව්ජින්ද මැසනොද් තුමාගේ ලස්සන පින්තූරයකින්. ශ්‍රී ලංකා කතෝලික සභාව තුළ විශේෂයෙන් සමරන ධර්මදූත මුනිවරුන් අතර ශු. එව්ජින්ද මැසනොද් තුමන් සුවිශේෂී ස්ථානයක් ගනු ලබනවා. පුංචි ඔබත් ජීවිතයේ කැඳවීම් තෝරා ගන්නට සූදනම් වන ළමා වයසේදීම මෙතුමාණන් ගැන හොඳ අවබෝධයක් ලබා තිබෙනවා නම් ඉදිරි ජීවිත මඟ සකසා ගන්නට එතරම් අපහසු වන්නේ නැහැ.

ආදර දුවේ පුතේ,

ශු. එව්ජින්ද මැසනොද් තුමා උපත ලැබුවේ ප්‍රංශයේදීයි. ක්‍රි:ව: 1782 අගෝස්තු 1 වන දින මෙලොව උපත ලද චාල්ස් ජෝශප් එව්ජින්ද මැසනොද් තුමන්ගේ පළමු හත් වසර ඉතාමත් වාසනාවන්තව සුවපහසුව ගෙවුන වකවානුවක් බව සඳහන් වෙනවා. එතුමන්ගේ දෙමාපියන් වුයේ ප්‍රංශයේ වංශාධිපතියෙක් වූ චාල්ස් මැතිතුමන් සහ මධ්‍යම පාංතික රූමත් කාන්තාවක් වූ මාරි රෝස් ජොආන්ස් මැතිනියයි. දකුණු ප්‍රංශයේ පිහිටි එක්ස්වින් ප්‍රොවාන්ස් ග්‍රාමයේ තුළයි මෙම පවුල ජීවත් වූයේ. ප්‍රංශයේ ප්‍රභූ පැලැන්තිය භුක්ති විඳින සියලු වරප්‍රසාද මෙම පවුලටත් භුක්ති විඳින්නට අවස්ථාව ලැබුනා. පවුල තුළ කිතුනු වටිනාකම් මත මැසනොද් පවුල ජීවත් වුවත් ලෞකිකත්වයෙන් පිරුණු ඉහළ සමාජ පැලැන්තියේ ආභාෂයත් තරුණ මැසනොද් උපරිමයෙන්ම අත් දැක්කා.

ඒ 1789 වසරයි. ප්‍රංශ විප්ලවය ආරම්භ වු ඒ වසරේදී ඇති වු මහා විප්ලවිය පෙරලිය තුළ එව්ජින්ද මැසනොද් පවුලටත් මහත් ව්‍යසනයන්වලට මුහුණ පාන්නට සිදුවූවා. එම පවුල ප්‍රංශයෙන් පැන යන්නට තීරණය කරනවා. මේ නිසා 1789 සිට පුරා අවුරුදු 11 ක්ම එව්ජින් පවුල ජීවත් වන්නේ විදේශගතවයි. ඒ අනුව නීසියේ සිට ටියුරින් වලටත්, වැනීසියටත් , නේපලස්වලටත්, පැලමෝර් වලටත් පලා යමින් ජීවත් වන එව්ජින් එම නගර වල ප්‍රිය සම්භාෂණ හා ලෞකිකත්වයෙන් පිරුණු ජීවිත රටාවලට අතරමැදිව අභියෝගාත්මකව ජීවත් වෙනවා. නැවතත් තරුණ එව්ජින් තමන්ගේ මව් රටවු ප්‍රංශය බලා යන්නේ 1802 වසරේදීයි. ඒ වන විට ප්‍රංශයේ පැවැත්ම සම්පූර්ණයෙන්ම වෙනස්වයි පැවතුනේ. ඒ සියල්ලටම හේතුව ප්‍රංශ විප්ලවයයි. අවුරුදු විස්සක තරුණයකු වන එව්ජින් ඉන් පසුව තම මව සමඟ ජීවත් වීමට මව්රට බලා එද්දි තමන්ගේ පියා තම මවගෙන් දික්කසාද වී තිබුණා. බිඳුණු පවුල් රටාවක් ඉන්පසු මැසනොද් පවුලෙන් දිස් වුවත් නොසැලුන එව්ජින් 1808 වසර තෙක් ඒ සියල්ලට මුහුණ දෙමින් නිර්භයව ගමන් කරනවා.

ආදර දුවේ පුතේ,

මේ වකවානුව වන විට තරුණ එව්ජින්ගෙ ජීවිතයේ විශාල පෙරලියක් සිදුවෙනවා. 1808 දී එව්ජින් පූජකවරය පතා දෙව්සත්හලට ඇතුළු වෙනවා. දෙවි සමිඳුණන්ට තමන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් කැප කළ තරුණයෙක් හැටියටත්, තමන්ට විශේෂ දූත කාර්යයක් ඉටු කිරිමට තිබෙන බව වටහා ගැනීමටත් මේ පුහුණු කාලය තුළදී තරුණ එව්ජින් මැනවින් වටහා ගන්නවා.

1811 වසරේදි එතුමන් පූජකවරය ලබා ගන්නවා. ඉන්පසුව ආධ්‍යාත්මික පාලුකරයක් වන් දේශයක තමන්ගේ දේව කැඳවීම බල ගන්වන එව්ජින් පියතුමා බොහෝ දිළිඳු ජනතාවගේ සිත් දිනා ගත් ධර්මධරයෙක් බවට පත් වෙනවා. ''දිළිඳුනට සුබ අස්න දෙසීමට මා මවන ලදී'' යන සුවිශේෂී තේමා පාඨය මුල් කරගෙන ධර්මදූත මෙහෙවරහි යෙදුන එව්ජින් පියතුමා සිය කාර්යයෙහි තිබූ භාරදූර බව අවබෝධ කරගෙන නව ධර්මදූතික නිකායක් බිහි කිරීමට අඩිතාලම දමනවා. ඒ අනුව 1826 පෙබරවාරි 17 වෙනිදින ශුද්ධවූ සභාවේ නිල අනුමැතිය ලත් එම නිකාය ''නිමල මරියාවන්ගේ පැවිදි නිකාය'' ලෙස නම් කරනු ලබනවා.

එද මෙද තුර ලෝකයේ රටවල් හැත්තෑවක පමණ විසිරී ධර්මදූත සේවයේ නියැලෙන නිර්මල මරිය පැවිදි නිකායේ මූලික පරමාර්ථය වනුයේ දිළිඳුනට සුබ අස්න දේශනා කිරීමයි. මර්සල්ස් පදවියේ රදගුරු තුමා වශයෙන් අති සුවිශේෂී දේව සේවයක නියැලුනු එව්ජින්ද මැසනොද් තුමන් 1861 මැයි මස 21 වෙනි දින ස්වර්ග ස්ථ වෙනවා. 1995 දෙසැම්බර් 03 වෙනි දින භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියතුමන් විසින් සාන්ත සභාව තුළ එව්ජින් ද මැසනොද් තුමන්ව ශුද්ධවන්ත භාවයට ඔසවනු ලබනවා.

එතුමන්ගේ පහස තුළ ඒ ආදර්ශය අනුව යමින් පුරා අවුරුදු 160 ක පමණ කාලයක් ශ්‍රී ලංකාව තුළ සේවය කරන නිර්මල මරිය නිකායික පියතුමන්ලා , සැබෑ ධර්මධරයන් හැටියට ශු. එව්ජින්ද මැසනොද් තුමන්ගේ ජීවිත දැක්ම තුළ පිහිටා දිළිඳුන්ට සුබ අස්න දේශනා කිරීමේ මහඟු මෙහෙවරේ නිරත වී සිටිනවා.

ආදර දුවෙ පුතේ, ශු.එව්ජින්ද මැසනොද් තුමන්ගේ ජීවිත අත්දැකීම තමන්ගෙ තරුණ වයසේදීම ප්‍රකාශ වන්නේ තම අම්මට ලියු ලිපියේ මෙන්න මේ කොටසින්.

''අප ස්වාමින් වහන්සේ මාගෙන් බලාපොරොත්තු වන්නේ අධ්‍යාත්මික ගැලවීමක් කෙලසවත් අපේක්ෂා කළ නොහැකි, ලෞකීක ආශාවන් මා පරිත්‍යාග කිරිමයි, ඒ වෙන කිසිවක් නිසා නොව මනුෂ්‍යයා තුළ පිරිහිමකට ලක්ව ඇති දේව විශ්වාසය නැවත නගා සිටුවීමටත්, විවිධ තත්ත්වයන් තුළ අන්ත අසරණ දිළිඳු තත්ත්වයකට ඇද වැටී ඇති ජනතාවගේ ආධ්‍යාත්මය ගොඩනංවාලීමටත්ය''

ආදර දුවේ පුතේ, සිය ජීවිතයෙන් මේ කී සියල්ල සැබෑවටම ඉටු කළ නිසා සාන්තු වරයෙක්සේ විශාල ගරු බුහුමනකට අදත් එතුමන් නම් වී සිටිනවා. ඔබත් තව කියවා එතුමන් ගැන දැනගත යුතුයි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# කුරුණෑගල පදවි බයිබල් රැළිය

ඩී.කේ.ටී. රෙජිනෝල්ඩ් විසිනි.

කුරුණෑගල පදවි බයිබල් රැළිය පසුගියදා කුලියාපිටිය සත්පහන ශාලාවේදී කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙහිදී පැවති බයිබල් දැනුම මිනුම තරගයෙන් සමස්ත ශූරතාව දිනාගැනීමට මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් දේවස්ථාන කණ්ඩායම සමත් වුණි. මෙහි අනුශූරතාවය හිමිවුයේ උඩුබද්දව ශු. ජොහානදක් මුනි දේවස්ථානය නියෝජනය කළ කණ්ඩායමටයි.

මෙම අවස්ථාවට කුරුණෑගල විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන් පිරිස් හිමිපාණන් අනුනායක අතිගරු ඔස්ටින් මාකස් කුරුණෑගල පදවි පරිපාලන නාහිමි අති ගරු පියල් ජානක ප්‍රනාන්දු , කුරුණෑගල පදවි බයිබල් අධ්‍යක්ෂ ගරු උපුල් ද සිල්වා යන පියතුමන්ලා ඇතුළු ගරු පියතුමන්ලා, පැවිදි සොයුරියන්, දරු දැරියන් හා දෙමාපියන් විශාල ප්‍රමාණයක් සහභාගී වුහ.

ශූරතාවය හා අනුශූරතාවය දිනු කණ්ඩායම් රදගුරු හිමිපාණන් මල්පිටිය මීසම් සේවක ගරු ජෝර්ජ් ලින්ටන් පෙරේරා, උඩුබද්දාව මීසම් සේවක ගරු බෲනෝ ගාමිණි පියතුමන්ලා ගරු උපුල් ද සිල්වා පියතුමන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයාරුවකට පෙනිසිටි අයුරු.



ශූරතාවය දිනු කණ්ඩායම



අනු ශූරතාවය දිනු කණ්ඩායම

# ගම්පහ දිසා සිසුනායක නයිකාවන්ට වැඩමුළුවක් මීරිගම දී



ගම්පහ දිසාවේ දහම් පාසල් වලින් තෝරා ගත් ශිෂ්‍ය නායක නායිකාවන් හට වැඩමුළුවක් ඉකුත්ද මීරිගම ශු. ජපමාල දේවමාතා දේවස්ථානයේ ගම්පහ දිසා ධර්මෝපදේශ අධ්‍යක්ෂ, මීරිගම මිසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ පැවැත්විණි. ළමුන් 50 අධික පිරිසක් සහභාගි වු මෙම වැඩමුළුවේ දිව්‍ය පූජා යාගයෙන් පසු සැම දෙනා ජායාරූපයකට පෙනී සිටි අයුරු

**සේයා සහ සටහන :- ටෙරන්ස් ශානක - මීරිගම**

# වන්දනීය ඉමෙල්ඩා තුමිය



**මැයි මස 13 වන දින මංගල්‍යය යෙදී ඇති වන්දනීය ඉමෙල්ඩාතුමිය ශු. සභාවේ ළමා සාන්තුවර නාමාවලිය තුළ බැබළෙන තරුවකි. ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ නාම  සාන්තුවරිය ලෙස සලකනු ලබන එතුමිය ඉතාලියේ බොලොඤ්ඤාහි උපත ලැබුවාය. ඇගේ පියා එගානේ ලැම්බර්ටනි  වු අතර මව කැස්ටෝරා ගැලුසේ වුවාය. මේ බැතිමත් යුවල දෙවිඳුන්ට ඉතා ගැඹුරු ප්‍රේමයකින් විසු අතර කුඩා කල සිටම තම දරුවන් හට සත්‍ය විශ්වාසය කෙරේ දැඩි භක්ත්‍යාදරයක් ඇති කරන්නට ද ඔවුහු සමත් වුවෝය.**

ඉමෙල්ඩා තුමියගේ පියා ගැරිසන් නුවර නායක කපිතාන්වරයා ලෙස සේවය කළ අතර ඔහුගේ දැහැමි හා නිර්භිත දිවිය උදෙසා සියල්ලෝ ඔහු කෙරේ පැහැදි සිටියෝය. කුඩා කල සිටම ඉමෙල්ඩා දැරිය අනුන්ට සුබසෙත ඉටුකරන්නට ද සතුටු වුවාය. මුළු හදින්ම දෙවිඳුන්ට පෙම් කළ ඇය නිතරම ඔවුන්වහන්සේ ගැන හැඟීමෙන් යැදුමින් ද ශු. ජපමාල උච්චාරණය කිරිමෙන්ද පෝෂණය වුවාය.

සත්ප්‍රසාදික සමිඳුන් ළඟ සිටිද්දී ප්‍රීතියෙන් උතුරා යන හදින් සිටි ඇය, දිව්‍ය සත්ප්‍රසාදිය සක්‍රමේන්තුව තුළින් ජේසු සමිඳුන් තම හදට වඩවා ගන්නට බොහෝසේ ආශා වුවාය. ඒ දිනය තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියාය ලාබාල කාලයේදී ම පැවිදිවරියක ලෙස තම දිවිය සමිඳුන්ට කැප කිරීමට සිතාගත් ඈ, දෙමාපියන්ගේ ආශිර්වාදය මැද වයස අවු. 9 දී වාල්ස්පිට්රා හි දොමිනුකාන කන්‍යාරාමයට ඇතුළු වුවාය. තමන් කිතු සමිඳුන්ට අයත් බව තේරුම් ගත් එතුමිය පැවිදි දිවියට ඉතා ගැඹුරින් ආශා වුවාය. ඇගේ යහපත්කම ජ්වලිතකම හා අනෙකුත් යහගුණ නිසා කන්‍යාරාමයේ විසු සියල්ලෝම මේ පුංචි ඉමෙල්ඩා හට ආදරය කළෝය. එකල දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට හැකිවුයේ වයස අවු 12 දිය. ඇය සමිඳුන් තම හදවතට වඩවා ගැනිමේ ආශාව පල කරමින් නිතර එතුමන්ට ආයාචනා කළේ කඩිනමින් ඇය වෙතට එන ලෙසටය. ජේසු සමිඳාණෝ මෙම කුඩා පැතුම හා ආශාව ඉටු කළ සේ ක.



ඇයට වයස අවුරුදු 10 වු කල ඒ වසරේ අහස්නැඟිමේ මංගල්‍යයට පෙර දින සන්ධ්‍යා දිව්‍ය පුජා මෙහෙයේදී දිවරහස් කිරීමෙන් පසු දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් කෙරේ නෙත් යොමු කළ ඉමේල්ඩා ''ස්වාමිනි ඔබ වහන්සේ මා වෙතට වඩින්නට මම සුදුස්සෙක් නොවෙමි . ඇය අන් අය සමඟ ඉතිරි කොටස කියනු වෙනුවට ''වචනයක් පමණක් වදාළ මැනව , එවිට මා කොතරම් නුසුදුසු වුවත් ඔබවහන්සෙ ලබා ගන්නෙමී'' යි පැවසුවාය. දිව්‍ය පුජාවේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ වෙලාව පැමිණියෙන් අන් සියල්ලෝම දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ලැබුහ. ස්තුතී කිරීමේ යාච්ඤාවෙන් ඉක්බිති දිව්‍ය පුජා යාගයද නිම විය. සියල්ලෝම දෙව් මැඳුරෙන් නික්ම ගියහ.

පුංචි ඉමෙල්ඩා තවමත් දනින් වැටී යාච්ඤා කරමින් සිටියාය. දෙව් මැඳුර භාරව කටයුතු කළ සොයුරිය පමණක් දේවස්ථානයේ සිටියාය. හදිසියෙම යමක් දැකිමෙන් එම සොයුරිය පුදුම වුවාය. කුඩා ආධුනික වු ඉමේල්ඩාගේ හිසට ඉහළින් ශු. පූපයක් රැඳී තිබෙන බවක් දැක පුදුම වුවාය. පුංචි ඉමෙල්ඩා දැත් තම ළය මත තබාගෙන ධ්‍යානපරව ඒ දෙස බලා සිටින ආකාරය ඇය දුටුවාය. වහාම දෙව්මැඳුරේ සේවය කළ උපාධ්‍ය පියතුමාට හා සෙසු කන්‍යා සොයුරියන්ට මේ බව සැළකළ විගස පැමිණ ඔවුහු දණින් වැටි නමස්කාර කළෝය.

කුඩා තැටියක් ගෙන ශු. පුපය ඒ මත පතිත කළ පියතුමා එම ශ්‍රී පුපය ලබා ගැනීමට පුංචි ඉමෙල්ඩා ට සැලැස්විය.

ඉමහත් භක්ත්‍යාදරයෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත් ඇය තව දුරටත් යාච්ඤාවේ යෙදී සිටි අතර ඇය නොසෙල්වී සිටි නිසා ප්‍රධාන මව්තුමිය ඉතා මෘදු  ලෙසින් ඇය නැඟිටුවන්නට තැත් කළ අතර ශ්‍රේෂ්ඨ මව්තුමියගේ උරහිස මතට ඇය ඇද වැටුණාය දිව්‍ය සත්ප්‍රසාදීය සමිදුන් ලැබු පහසින් උතුරා යන ප්‍රිතියෙන්, පසු වු හෙයින් ඇය ස්වර්ගස්ථ වී සිටියාය.

අද දක්වා ම ඉතාලියේ වාල්ස්පිට්රාහි දොමිනිකාන කන්‍යාරාමයේ එතුමියගේ සිරිසිරුර නොදිරා පවතින්නේය. ඇගේ මංගල්‍යය මැයි මස 13 වන දින සමරන අතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ ආරක්ෂක මුනිවරිය ලෙස සභාව ඇය ව නම් කර ඇත.

අසේල දසනායක

# නාත්තණ්ඩිය සා. ජෝශප් සිඟිති දූ පුතුන්ගේ අවුරුදු අසිරිය







නාත්තන්ඩිය දේව ආරක්ෂාවේ පැවිදි සොයුරියන් විසින් පවත්වාගෙන යනු ලබන සා. ජෝශප් පෙර පාසලේ අලුත් අවුරුදු උත්සවය පසුගිය දා ළදරු පාසල් භූමියේදී පැවැත්වුණි. නාත්තන්ඩිය සිද්ධස්ථාන පාලක ගරු උපාලි චර්චිල්, සහයක ගරු දුමින්ද සුරේෂ් හා ගරු රිචඩ් පීරිස් යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙයට ළමුන්ගේ සහභාගීත්වයෙන් අවුරුදු ක්‍රීඩා රැසක් පැවැත්වුණි. මෙදින තේරී පත් වූ සිඟිති අවුරුදු කුමරා , කුමරිය හා ළමුන් තරගයකට සහභාගිවන අයුරු මෙහි දිස්වේ.

**සේයා සහ සටහන**
**ශ්‍රීයාංගනී පිලීෂියා.**

## අපේ ආදර දේව අම්මා

මරියතුමී අපි හැමෝගෙම අම්මාය. ඇය ඉතාම බැහැපත්, කීකරු කෙනෙකි. ජේසුස් වහන්සේගේ මව වීමට ද ඇයව තෝරා ගනු ලැබුවාය
මැයි මාසය ඇය වෙනුවෙන් කැප වූ මාසයයි. මරිය තුමියගේ යහපත් ගුණාංග අපගේ ජීවිතයට එක් කර ගනිමු.

**එම්.චනෝද්‍යා තරුෂි**
3 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - මාරවිල

මාසික
සිතිවිල්ල



**මාසික සිතිවිල්ල - අප්‍රේල් මාසය ජයග්‍රාහී නිර්මාණය**

දස මසක් කුසේ දරා
මා මෙලොවට
බිහි කළ අම්මා
නව ජීවිතයක් දී
මෙලොවට එවලා
ඒ නිසාද අම්මේ
මම හිනැහෙන්නේ
පුංචි තොටිල්ලක පද්දාලා
නිදි කරවන්නකො මාව
ඔබගේ ආදර
සොඳුරු වදනින්
මා අමතා ..........
උණුසුම දෙන්නට ගන්නකෝ
තුරුලට
ආදර අම්මේ.

**දේශාන් නවංජන අප්පුහාමි**
9 ශ්‍රේණිය
ලොයොලා විදුහල - මීගමුව.



සේයා :- ශ්‍රීයාංගණී පිලීෂිය
**මාසික සිතිවිල්ල**
"මැයි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

★ **දේව ප්‍රසාද නිධාන සඳහා භාවිත කරන තෙල වර්ග හඳුන්වා දී ඒවා කුමන ප්‍රසාද නිධාන වෙනුවෙන් භාවිත කරන්නේ ද යන්න සඳහන් කරන්න.**

**OC - OLEUM CATECHUMENORUM** ඕලේවුම් කැටකුමෙනොරුම්
ප්‍රසාද ස්නාපනයේ පූර්වාලේපන වශයෙන් භාවිතා කරයි. පොඩි ළමයින්ගේ පපුවේ ද, වැඩිහිටියන්ගේ දෑතේ ද, ආලේප කරනු ලැබේ.

**OI - OLEUM INFIRMORUM** ඕලේවුම් ඉන්ෆිර්මොරුම්
රෝගීන් සඳහා භාවිත කරනු ලැබේ.

**SC - SANCTA CHRISMA** සන්ක්ටා ක්‍රිස්මා
ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපනය සහ පූජාත්වරය සඳහා භාවිත කරනු ලැබේ. ඔලිව් තෙල් සමඟ සුවඳ ද්‍රව්‍ය මුසුකර සාදනු ලැබේ. මුසුකරන ලද සුවඳ ද්‍රව්‍ය මත තෙල් වෙනස් වේ.

★ **සභාව තුළ විශේෂ කාර්යයන් පවරන ප්‍රසාද නිධාන තුනක් තිබේ. ඒවා කවරේද?**
(මෙම ප්‍රසාද නිධාන පෞද්ගලික ජීවිතයට පමණක් නොව මුළු සමාජයටම බලපායි.)

- අභිවෘද්ධි ආලේපනය - නිල සාක්ෂිය
- පූජකවරය - දේව ජනතාවට සේවය
- ආශිර්වාදකාර බන්ධනය - පවුල ශුද්ධවත් කිරීම

## ආරම්භක ප්‍රසාද නිධාන

★ **ක්‍රිස්තියානි ජීවිතයේ ආරම්භක ප්‍රසාද නිධාන කීයද? ඒවා මොනවාද? ඒ අතරින් ප්‍රධාන තැනක් හිමි වන්නේ කුමකටද?**

- ප්‍රසාද ස්නාපනය
- අභිවෘද්ධි ආලේපය
- දිව්‍ය සත්ප්‍රසාදය

මෙම ප්‍රසාද නිධාන අතරින් ''දිව්‍ය සත්ප්‍රසාදය'' ප්‍රසාද නිධානයන්ගෙත් ප්‍රසාද නිධානය යන නමින් හැඳින් වේ.

★ **ආරම්භක ප්‍රසාද නිධානවල ඇති වැදගත්කම කුමක් ද?**

- ආරම්භක ප්‍රසාද නිධාන ලබාගැනීම මගින් දේව ජීවිතයේ මහඟු නිධානයන් වැඩි කරගන්නට ප්‍රේමයේ පූර්ණත්වය කර, ක්‍රමයෙන් ප්‍රවිශ්ට වන්නටත් අවස්ථාව සැලසීම.

## ප්‍රසාද ස්නාපනය හෙවත් බෞතිස්ම ස්නාපනය

**ප්‍රසාද ස්නාපනය යනු කිමෙක් ද?**

ජන්ම පාපයෙනුත් කර්ම පාපයෙනුත් අප නිදොස් කැර දේව දරුකමටත් ශුද්ධ වූ සභාවේ සමාජිකත්වයටත් අප ඔසවන ප්‍රසාද නිධානය, ප්‍රසාද ස්නාපනය වේ.

**ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී භාවිත වන ද්‍රව්‍ය හා රූපය කවරේද?**

- ද්‍රව්‍ය - ස්වභාවික ජලය
- රූපය - ක්‍රියාව අර්ථවත් කෙරෙනු පිණිස රූපය වශයෙන් ''පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබ ස්නාපනය කරමි'' යන වචන, ජලය හිස මත වක් කරමින් උච්චාරණය කළ යුතුය.

**ප්‍රසාද ස්නාපනයෙන් හිමිවන පොදු පූජකවරය සුවිශේෂි තත්ත්වයට පත්වන්නේ කුමන ප්‍රසාද නිධානවලින්ද ?**

- පූජකවරය, ආශිර්වාදකාර බන්ධනය




# තේක්කපිටියේ තතු

**කර්තෘ**

**ආචාර්ය ඩබ්ලිව් .එල්.ඒ.දෙන්පීටර් පියතුමා**

**මිළ රු. 100/=**




**ශිරාන් මෛත්‍රී**

ආචාර්ය ඩබ්ලිව් .එල්.ඒ. දෙන් පීටර් මාහිම්පාණන් අපේ දූ දරු පරපුරේ කියවීමේ නුවණ වැඩි වර්ධනය කිරීම සඳහා ඉතා රසවත්, හරවත් හා ගුණාත්මක ග්‍රන්ථ නිර්මාණය කිරීමේ රුසියෙකි. මේ බව සනාථ කරමින් ''තේක්කපිටියේ තතු'' නමැති මේ ග්‍රන්ථය හොඳම යොවුන් ග්‍රන්ථය ලෙස රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබුවේ 1999 දීය. එතුමන්ගේ සාහිත්‍ය කර්තව්‍යයේ ගුණමහිමය හුවා දක්වන්නට මෙය එක් නිදසුනක් පමණි.

තේක්කපිටියේ තතු ග්‍රන්ථය තේක්කපිටිය නම් ගම්මානයක් ප්‍රස්තුත කරගෙන නිර්මාණය කර තිබේ ගම්මානයේ නම මනඃකල්පිත වුවද නවකතාවේ හමුවන පුද්ගලයෝ ඔබේ මගේ ගම් නියම්ගම් කොතැනත් වෙසෙති. හොඳ හා නරක යන ගුණයෙන් පිරි සියලු ජනකොටස් අපේ සමාජයේ වෙසෙති.

මෙහිදී සුදු මැනවින් හඳුනාගැනීමට කළු මහෝපකාරී වන්නාසේ සුදනන් හොඳින් දැන හඳුනා ගැනීමට දුදනන් ඒ හා සමඟ සිටිය යුතුය. එහෙත් කතුවර පියතුමා ඉතාමත් පරිස්සමෙන් යුතුව දුදනන් සුදනන් වෙන් කොට ඉදිරිපත් කිරීමටත්, දුදනන් මඟ නොයා සුදනන් ඇසුරු කරමින් දුර්ජනයන්ගේ අධර්මිෂ්ටකම් වලින් ඈත්වී සිටිමටත් කතාව තුළින් දූ දරුවන්ට මඟ පෙන්වයි.

හොරෙන් කැලේ ගස් කැපීම ගැන ලියැවුණු මේ පාඨය කියවා බලන්න. (සිරිසේන සිට මුදලාලි දක්වා ( පිටුව 30)

මේ ආදි වශයෙන් විවිධ අකටයුතුකම් සමයේ දූෂණ හා අපරාධ මැද යහපත වැඩි වැඩියෙන් සමාජගත කරන්නට දුක් පීඩා විඳ ගනිමින් කටයුතු කළ යුතු අන්දම කතුවර පියතුමා සිය ග්‍රන්ථයෙන් අපූරුවට ගෙනහැර දක්වයි. මර්කේලිස් ...... යනුයි (පිටු 58/59)



## සිසු නායක පදක්කම් පැළැඳවීම

**කඩවත ශු. අන්ද්‍රේ අවිල්ලීනු දහම් පාසල**

කඩවත ශු. අන්ද්‍රේ අවිල්ලීනු දහම් පාසලේ සිසු නායක නයිකාවෝ පසුගිය ද පදක්කම් පැළඳුහ. පදක්කම් පැළඳවීම කඩවත මීසම් සේවක ගරු සුනිල් කුමාර පීරිස් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. පදක්කම් පැළඳි සිසු නායක නායිකාවන් ගරු පියතුමා සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු...



✍ ප්‍රියන්ත විජේසිංහ

# වැඩිම නම් ගණනාවකින් බුහුමන් පු

දේව මාතාව මරියාවන් බැව් කවුරුත් දනිති. ලෝකය ගලවා ගැනීමේ කාර්යය උදෙසා දෙවියන් වහන්සේ සිය ඒක ජනිත පුත්‍රයාණන් මෙලොවට ජනිත කිරීමට එතුමියව තෝරා ගත් සේක. මරිය තුමියද දේව අණට හිස නමා ඉතා නිහතමානීව ගැලවීමේ කාර්යය උදෙසා දායක වුවාය. කුරුස ගසේදී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙලෝ වාසීන් එතුමියට බාර දුන් සේක.

එදා මෙදා තුර ලොව නන් දෙසින් නැගෙන මරිය බැතිය හමුවේ ලෝකයේ වැඩිම නාමයන් සංඛ්‍යාවකින් පිදුම් ලබන එකම මාතාව එතුමිය වන්නීය. ඒ සැම දෙයින්ම යළි යළිත් තහවුරු වන්නේ දේව මාතාවන් කෙරේ


තුෂාරයේ අප ස්වාමි දූ


සාගරයේ තාරකාව

ලෝක වාසීන් තුළ පවත්නා බැතියාවයි. මේ සමඟ දැක් වෙන්නේ එවන් නම් කිහිපයකින් හඳුන්වන දේව මාතා වහන්සේය.

**තුෂාරයේ අප ස්වාමිදුව** - අති උත්තම පියුස් ශුද්ධෝත්තම පියතුමා 1568 දී රෝම දින දසුනට මෙය එකතු කළේ දේව මාතාවන් කෙරේ බැතියෙනි.

**සාගරයේ තාරකාව** - සින්දත්‍රි දේව මාතාවන් ලෙස ධීවරයන් හා නාවිකයන් අතර පතළ මේ



යහපත් අනුශාසනාදායක මාතාව

නාමය අති උතුම් 12 වැනි පියුස් සසුන් පියාණන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**ක්‍රිස්තියානින්ගේ බොහෝ පිහිටාධාර මාතාව** - ජෝන් ක්‍රිසෝස් ටෝම් නම් තැනැත්තා වර්ෂ 345 මැයි 24 වැනිදා දේව මාතාවන් සඳහා මේ නාමය කැබුවේ කිතුනු



# ...ුදන ලෝකයේ එකම මාතාව

කිතුනු උරුමය



ස්වර්ගයීය රැජින

පීඩනයෙදී ලත් පිහිටාධාරය උදෙසා.

**ප්‍රඥාවේ කිරුළ** - 11 හා 12 සියවස්වල දී සභා වේදභේදයන් හමුවේ මරිය මාතාවන්ගේ මධ්‍යස්ථකමට උපකාර ලෙස පීටර් ඩේමියන් සහ ගයිබර්ට් ඩි නොජන්ට් දෙදෙනා මේ නාමය තැබූහ.

**ස්වර්ගයීය රැජන** - අති උතුම් 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමාගේ Ad Calli reginoun නම් විශ්ව ලේඛනයේ දේව මාතාව මේ නමින් හැඳින්විය.

**කරුණාවේ මාතාවෝ** - 13 වැනි සියවසේ මධ්‍යම යුරෝපයේ සහ ඉතාලියේ පැතිරගිය මහාමාරිය වසංගතය හමුවේ දේව මාතාවන්ගේ මධ්‍යස්ථකම අයදිමින් මේ නමින් ආමන්ත්‍රණය කළහ.



ප්‍රඥාවේ කිරුළ



ක්‍රිස්තියානින්ගේ පිහිටාධාර මාතාව

**යහපත් අනුශාසනදයිකා අප ස්වාමිදු** - 13 වන සියවසේ දේව මාතාව සෑම සියලු යහපත් දේවල අනුශාසනාදයිකාව ලෙස ප්‍රකාශයට පත්කරමින් මේ නම ව්‍යවහරයට ගැනිණ.

දේව මාතාවන් හඳුන්වන්නට මෙවන් නම් දහස් ගණනාවක් ඇත. එ සියල්ල එක්වර හඳුන්වා දීමට නොහැකිය. ඉදිරියේදී ඒ ගැන සිතා බලමු. මේ ලස්සන මැයි මාසයේ මල් කුමරිය බඳු මරිය රැජනට නිතිපතා යදින්න.



කරුණාවේ මාතාවෝ

ශිරාන් මෛත්‍රි

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 53**

**Each and Every** කියන වචන දෙක එකට යෙදෙන අවස්ථා තිබෙනවා.

**Each and Every one** of the audience **was** checked by the guards.
(ඊච් ඇන් එව්රි වන් ඔෆ් දි ඕඩියන්ස් වොස් චෙක්ඩ් බයි ද ගාඩ්ස්)
ප්‍රේක්ෂක සභාවේ හැම කෙනෙක්ම (එක්කෙනෙක් නැර) ආරක්ෂක නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලැබුවා.

**Each and Every book** of the library **was** properly numbered.
(ඊච් ඇන්ඩ් එව්රි බුක් ඔෆ් ද ලයිබ්‍රරි වොස් ප්‍රොපලි නම්බර්ඩ්)
මේ පුස්තකාලේ හැම පොතකටම (එකක් නැර) පිලිවෙලට නොම්බර යොදා තිබුනා.

*සුළු පිරිසක් ගැන කතා කිරීමේදී Each වඩා ප්‍රයෝජනවත්.*
I have three dogs. මට බල්ලෝ තුන් දෙනෙක් ඉන්නවා.
**Each dog** is a different colour. හැම බල්ලෙක්ම (එක් එක් බල්ලා වෙනස් පාටක්)

**Each player** of the team was wearing a yello T - shirt.
කණ්ඩායමේ හැම ක්‍රීඩකයාම (එක් එක් ක්‍රීඩකයා) කහ පාට ටී ෂර්ට් එක බැගින් ඇඳගෙන හිටියා.

***Every** බොහෝ විට යොදන්නේ විශාල සංඛ්‍යාවකින් යුත් පිරිසක් හෝ දේවල් ගොඩක් ගැන කීමට.*

යම් කිසි පිරිස්/ හෝ දේවල් සමූහයකින් දෙකක් පමණක් පිළිබඳව කතා කරද්දී භාවිතා කෙරෙන්නෙ Each මිසක් Every නෙමේ.

**Two boys** came to see me. **Each boy** was wearing a blue shirt.

මාව මුණ ගැහෙන පිරිමි ළමයි දෙන්නෙක් ආවා. ඒ දෙන්නම (එක් එක්කෙනා) නිල්පාට කමිසයක් ඇඳල හිටියා.
මෙසේ Every boy (හැම ළමයෙක්ම) කියන්න බෑ.

යම් කිසිවක් සිදුවන වාර ගණන කීමේදී අපි Every භාවිතා කරන නමුත් Each භාවිතා කරන්නේ නෑ.

**"Every day"** She goes to church. (Each day නෙමේ)
My brother plays football **every Sunday**. (Each Sunday නෙමේ)

**Every morning** he greets me with a " good morning"
හැම උදේකම ඔහු සුභ උදෑසනක් වේවා කියල මට සුභ පතනවා. (Each morning නෙමේ)

There is a bus **every fifteen minutes**.
හැම විනාඩි 15 කටම වරක් බස් එකක් තියෙනවා. (Each fifteen minutes නෙමේ)

**Every day** is a new life for a wise man.
ප්‍රඥාවන්තයෙකුට හැම දවසක්ම අළුත් ජීවිතයක්. (Each day නෙමේ)

Each සහ Every යන වචන දෙක යෙදීමේදී ඇතැම් සමානකම් වගේ අසමානාකම්ද තියනවා. ඒ කියන්නෙ සමහර අවස්ථාවලදී each හෝ every යන වචන දෙකෙන් කෝක යෙදුවත් නිවැරදියි. තවත් අවස්ථාවලදී එහෙම යෙදෙන්නේ නෑ.

# දේව අම්මා අප ජීවිතයේ ආදර්ශය කර ගනිමු..



**සාතන්ගේ වෙස්ගෙන අප නිවසේ ආලින්දයට එන රූපවාහිනියේ විකාශය වන ටෙලිනාට්‍යය, විවිධ වැඩසටහන් නැරඹීමට කාලය වෙන් කර ගන්නට උත්සාහ කරන අප දේව මෑණියන් වෙනුවෙන් වෙන් කර ඇති මේ මාසය තුළ සතියකට එක් දිනක්වත් එතුමියට ජපමාලය උච්චාරණය කරන්නට කාලය ඉඩ ප්‍රස්තාව සකසා ගැනීමට වෙර දරමු. තවද, පවුලේ සියලු දෙනාම එකට එකතුවී දේව අම්මා වෙනුවෙන් කැපවූ මේ මාසය තුළ ජපමාලය උච්චාරණය කිරීමට සිතට ගනිමු.**

දේව අම්මා දයාව, කරුණාව බැහැපත්කම, නිහතමානිකම යන ගුණාංග තුළින් පිරිපුන් වූ ඇය දෙවිඳුන් කෙරෙහි පැහැදුණු භක්තිමත් කාන්තාවකි. දේව වචනය පිළිගනිමින් යහපත්වූද අර්ථවත්වූද ජීවිතයක් ගත කරමින් ඇය ජීවත් වූවාය.

දෙවියන් වහන්සේට විශ්වාසවන්ත ලෙසත් භක්තිමත් ලෙසත් ජීවත්වූ නිසා ඇය විශ්වාසයේත්, භක්තිමත් භාවයේත් අනුරුවක් ලෙසද හඳුන්වයි. දෙවියන් වහන්සේගේ ප්‍රශංසාවටද පත්වූ තැනැත්තියකි. ඇය පරිශුද්ධය, පවිත්‍රය. එදා ඇය තුළ තිබූ නිර්මලත්වය නිසාම ඇය ආශිර්වාදලත් තැනැත්තියක් වීමට භාග්‍ය ලද්දාය.

සමාජයේ විවිධ පුද්ගලයන් ඇසුරු කිරීමේදී ඇය බුද්ධිමත්ව කටයුතු කළ අතර අන් කිසිම දිනෙක සමාජයේ ගැරහුම් වලට ලක්වූයේද නැත.

**ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...**

**ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්යය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.**

**අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

අප ජීවිත අර්ථවත්ව ගත කිරීමට දේව අම්මා තුළ තිබූ ඒ වටිනා ගුණාංග ආදර්ශයට ගත යුතුව ඇත. ඒ මන්ද ඇය සැබවින්ම මානව දයාවෙන් හා ආදර්ශයෙන් පිරිපුන් ජීවමාන පිළිරුවක් බඳු නිසාමය.

අප බාහිර ලෝකය සමඟ උරින් උර ගැටෙමින් ජීවත් වන්නට උත්සහ කරන කාලයක අභ්‍යන්තර ආධ්‍යාත්මික නැඹුරු තාවයකින් යුතුව දේව අම්මා තුළ තිබූ යහපත් ගුණාංග යන් එක් කරමින් ජීවිතය පිරිපුන් භාවයකට පත් කරගනිමින් දේව මෑණියන් දෙවිඳුන් තුළ කැපවූ ජීවිතයක් ගත කළ ආකාරයට අපත් එතුමියට ගෞරවයක් වශයෙන් සතියකට එක් වතාවක්වත් ජපමාලය කියන්නට අදිටන් කර ගනිමු.

දේව අම්මා වෙනුවෙන් දවසේ සුළු මොහොතක් දෙන්නට ඔබට හැකිද? ඒ සඳහා ඉඩකඩ වෙන්කරන්නට ඔබ උත්සහ කරන්නේද?

සාතන්ගේ වෙස්ගෙන අප නිවසේ ආලින්දයට එන රූපවාහිනියේ විකාශය වන ටෙලිනාට්‍යය, විවිධ වැඩසටහන් නැරඹීමට කාලය වෙන් කර ගන්නට උත්සාහ කරන අප දේව මෑණියන් වෙනුවෙන් වෙන් කර ඇති මේ මාසය තුළ සතියකට එක් දිනක්වත් එතුමියට ජපමාලය උච්චාරණය කරන්නට කාලය ඉඩ ප්‍රස්තාව සකසා ගැනීමට වෙර දරමු. තවද, පවුලේ සියලූ දෙනාම එකට එකතුවී දේව අම්මා වෙනුවෙන් කැපවූ මේ මාසය තුළ ජපමාලය උච්චාරණය කිරීමට සිතට ගනිමු.

විශ්මා ප්‍රියංජලී
ශු. මිකායෙල් අග්‍රදූත තුමන්ගේ දෙව්මැදුර
(යටියන මීසම)



**කඳුකරයේ අසිරිය**

**ශොනායා සිල්වා**

04 ශ්‍රේණිය

ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"

ළමා ප්‍රදීපය, අංක 02,

ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**අසරණයන්ට පිහිට වෙමු**

**නියෝමාල් ජයසංඛ පෙරේරා**

11 ශ්‍රේණිය

මරිස් ස්ටෙලා විදුහල - මීගමුව



**මුව රංචුවක්**

**කවිනා කෙහාන්**

05 ශ්‍රේණිය

සාන්ත මරියා දහම් පාසල - හාල්දඬුවන

**කුරුළු සෙනෙහස**

**රවිඳු නයනජිත්**

08 ශ්‍රේණිය

ජේසු බිළිඳු දහම් පාසල

පොල්ගහහේන (හපුගොඩ මීසම)





**මල් මෝස්තරයක්**

**නෙත්මි කාවින්ද්‍යා**

04 ශ්‍රේණිය

ශු. පවුලේ ප්‍රාථමික බාලිකා විදුහල - මාරවිල



**සසිරු රශ්මික**

05 ශ්‍රේණිය

බැසිලිකා ප්‍රාථමික විදුහල

රාගම

**අපේ පවුල**

**අඳීෂා නිහාරි පොන්සේකා**

පෙර පාසල

ශා. මරියා දහම් පාසල

කටුකුරුන්ද මොරටුව





**පව්කරුවන්ට විමුක්තිය දුන් සමිඳාණෝ**

**දිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**

12 ශ්‍රේණිය

සිරිකුරුස දහම් පාසල

මීගමුව (මහවීදිය මීසම)

# සිතුවිල්ලක්...

මිනිස් ජීවිතය බලාපොරොත්තු, ඉලක්ක, අරමුණු, රාශියක් පොදි බැඳන් තරණය කරන්නා වූ අභියෝග , බාධක, හමුවේ මිනිසුන් වන අපට ඒ තුළින් ලැබෙන පන්නරය දේව ආශිර්වාදයක් ලෙසට සිතිය හැකිය. ප්‍රශ්න පිට ප්‍රශ්න පැමිණීමේදී ඇතැමුන් ජීවිතය පිළිබඳ කලකිරෙනු ඇත. නමුත් ඇතැමුන් ප්‍රශ්න කොතෙකුත් ජීවිතයට පැමිණියත් "මේවා නව ජීවිතයකට අලුතින් යමක් ඉගෙනීමට වෙස්වලා ගෙන පැමිණි ආශිර්වාදයක් ලෙසට හිතනු ඇත. තවත් සමහරු ගැටලු හමුවේ උදාසීනව කටයුතු කරති.

අවසානයේ ඔවුන්ම ඔවුන්ගේ ජීවිතය ගැන කලකිරෙනු ඇත. ප්‍රශ්න කරදර මිනිසුන් වන කාටත් පොදු දෙයකි. ප්‍රශ්න නැති කිසිවකු ලොව සිටිය නොහැක. සිටින්නේද නැත. බාහිර ප්‍රශ්න, පවුලේ ප්‍රශ්න, පෞද්ගලික ප්‍රශ්න, ආදි වශයෙන් නොයෙකුත් ප්‍රශ්න මිනිසුන්ට ඇත. ප්‍රශ්න කරදර කොතෙකුත් ජීවිතයට පැමිණියත් අප හැමවිටම ඒවා ප්‍රශ්න ලෙසින්ම නොදැක ඒවා අභියෝග විලසින් බාර ගත යුතුය. එවිට ඒවාට සාර්ථකව මුහුණ දීමට හැකිවනු ඇත. ඇතැම් විට තවත් පිරිසක් ජීවිතයට ප්‍රශ්න පිට ප්‍රශ්න පැමිණීමේදී ඒවාට සාර්ථකව මුහුණ නොදී ඒවායින් පලා යන අතරතුර දෙවියන්ට දොස් පවරයි. "ප්‍රශ්න එන්නේ අපිටමයි, දෙවියෝ අපි දිහා බලන් නෑ" ආදි වශයෙන් දොස් කියයි. නිරතුරුවම දෙවියන් අප මධ්‍යයේ ජීවමානව සිටින බව අප තරයේ විශ්වාස කළ යුතුය. දේව විශ්වාසය අප ළඟ කොතෙක් දුරට පැවතුණද ඇතැම් අවස්ථාවල අප දෙවියන් අත හැර යන අවස්ථාද ඇත. මිනිස් දුබල බව නිසා නිරතුරු පාපයට ඇදවැටෙන මිනිසා නැගිටවන්නටත් ශක්තිමත් කිරීමටත්දෙවියන්සූදානම්වසිටී.සෑමප්‍රශ්නයක්මඅපටඉදිරිපත් වූ අභියෝගයක් ලෙසට සිතා කටයුතු කිරීම සුදුසු වේ. දේව විශ්වාසය තුළ නිරතුරුවම ඒවාට සාර්ථකව මුහුණ දීමට ආශිර්වාදය ලැබෙනු ඇත.

නවංජනි තාරිකා ප්‍රනාන්දු
12 ශ්‍රේණිය (කලා අංශය)
හලා/වෙන්/ දංකොටුව බාලිකා විදුහල
දංකොටුව

# මව් සෙනෙහස

නෙළුම් විලේ පිපෙනා මල මම අම්මේ
ඒ මල රැකගන්නා මහ විල ඔබ අම්මේ
මේ ජීවිත කතරේ නපුරට ඇද ගන්නේ
අම්මේ නුඹයි මට පිළිසරණය වන්නේ

මහ සයුරේ බිඳුණු රුවල මම අම්මේ
ඔබයි හබල මා රුවලට පණ දුන්නේ
ජීවිතය කියා දුන්නේ මට නුඹ අම්මේ
ඔබේ සෙනෙහස කියනට නැත වචනය අම්මේ

**සචිනි සෙව්වන්දි**
**9 ශ්‍රේණිය**
**සා.මරියා දහම් පාසල**
**කටුකුරුන්ද**



දස මසක් මා කුසතුළ හොවාගෙන
ඇඟ ලේ කිරට හරවලා මට පොවාලා
මෙලොව එළිය දුටුදා පටන් මා ආදරයෙන්
රැකබලා ගත් පහන ඔබයි

අන්ධකාරයෙන් පිරුණු මගේ ජීවිතයට
නිතරම ආලෝකය ලබාදෙන පහන ඔබයි
ජීවිතය නැමැති නෞකාවෙන් එතර වීමට
මග පහදන එකම පහන් සිළුව ඔබයි

කම්කටුළු දිවි මගට දිරිය නිති
ලබා දුන්නේ ඔබයි
ආදරණීය මෑණියනී ඔබයි
මා ආදරණීය මෑණියනී ඔබ මට
මගේ මව් බිම හා සමකළ හැකිය
නිති සැම දින දිවි තිබෙන තුරා ඔබ මගේම
මෑණියන් වේවායැයි මා ප්‍රාර්ථනා කරමි

**දිල්ෂා සිතුමිණි**
**10 ශ්‍රේණිය**
**ශාන්ත සේවියර් දහම් පාසල**
**තල්ගහපිටිය**

## චතාරික ළමා ක්‍රියාකාරකම්

### පල්ලන්සේන මීසම

පල්ලන්සේන මීසමේ වික්ෂෝප දේව මාතා දේවස්ථානයේ 125 වන ජයන්ති වසර වෙනුවෙන් දහම් පාසල් දරු දැරියන් සඳහා එක් දින චතාරික ධර්ම විවේකයක් මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාගේ උපදෙස් පරිදි සහයක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ සංවිධානයෙන් පැවැත්වුණි.

මේ සඳහා පල්ලන්සේන ගර්භවාස දේව මාතා දුවන ශුධවූ ත්‍රිත්වය යන දේවස්ථානයන් හි දහම් ළමෝ එක්වුහ. ළමුන් දැනුවත් කිරීම සඳහා සබැඳි සොහොයුරු සොහොයුරියන් හා ගරු පැවිදි සොහොයුරියක් සහභාගිවුණි. දහම් ගුරුවර ගුරුවරියන් එක්ව දරුදැරියන් මෙහෙයවුහ.

**මෙල්වින්ද කොස්තා**



බලංගොඩ ශා. ජෝසප් දෙව්මැදුරේදී රත්නපුර දිසාවේ ධර්මදූත ළමා සමාජ චතාරික පාද නමස්කාරය සහ සුහද හමුව පසුගියද පැවත්වුණි. ඊට ධර්ම දූතික දූතිකාවන් 350 කට අධික ප්‍රමාණයක් සහ සජීවක සජීවිකාවන් 50 කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වුහ. මෙය සංවිධානය කරන ලද්දේ රත්නපුර පදවි ධර්මදූත ළමා සමාජ අධ්‍යක්ෂ ගරු ටෙන්සින් පෙරේරා , රත්නපුර දිසා ධර්මදූත භාර ගරු හරිහරන් රත්නප්‍රිය පියතුමන් සහ සංවිධායක මණ්ඩලය විසිනි. මේ සඳහා පියතුමන් පැවිදි සොහොයුරියන් හා දෙමාපියන්ගේ නොමද සහය මෙයට ලැබුණි. **බවන්ති ෆියෝනා කීගල්**

සජීවිකා - ධර්මදූත ළමා සමාජය - (බලංගොඩ ඒකකය)

## මතුගම සිඟිති අවුරුදු උළෙල ....

මතුගම සා. මරියා පෙර පාසලේ ළමුන්ගේ වාර්ෂික අවුරුදු උත්සවය පසුගියද දෙව් මැදුරු භූමියේදී මතුගම මීසම් සේවක ගරු දෙව්ෂාන් අසංක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙහිදි ළමෝ අවුරුදු සිරිත් විරිත් හා චාරිත්‍ර සිදු කළ අතර අවුරුදු ක්‍රීඩා සඳහා එක්වුහ.

මතුගම දොමිනිකානු නිකායික පැවිදි සොයුරියන්ගේ මග පෙන්වීම යටතේ පෙරපාසල් ආචාර්ය මඩුල්ල සහ දෙමාපියන්ගේ සහයෙන් මෙය සංවිධානය කෙරෙනි. **(කුමර නයනජිත්)**

## ප්‍රහේලිකා අංක 30



( සැකසුම - තිළිණි දූතිකා පෙරේරා )

**හරහට**

1.''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ............................ කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන .......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර .................... පාවිච්චි කරන බව පවසමින් අමොස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාව කැඳවුයේ ඔහු කුඩා කාලයේදීමය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ............................ මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ ................................ . නරක් වන්නේස'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස .................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙව් සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම .................

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 5/4, 6/37, 6/20, 15/30 , ආමොස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)

**ප්‍රහේලිකා අංක 30 සඳහා පිළිතුරු ලබන සතියේ**


අම්මෝ සීතල මදිවට
හිමකැට වැස්සක් වහිනවා.. ඉක්මනට ගෙදරට දුවන්න ඕනි..
5
..දැඩි සීතල නිසා කුඩා .මේරි.. බාල්දි දෙකට ..වතුර පුරෝගෙන ගෙදර දුවන්න ගත්තා...
සඳු කුමාරි
කථාව සහ චිත්‍ර.. ඇස්.ජී.ඊ.
අධික සීතල නිසා එයාගෙ මුලු ඇඟම සීතලෙන් මිදුන විගේ දැණුනා.. මිදුන අයිස්
කුට්ටියක... කකුල් හැපුන කුඩා මේරි බිම ඇද වැටුනා...
..අ... ..අම්මෝහ්...
එයාගෙ අත පය වල ඇඟිලි තියෙනවද කියලවත් එයාට දැණුනේ නැහැ..
අනේ දැං මොකද කරන්නෙ.. වතුර බාල්දි දෙකම පෙරළුනා
වතුර නැතුව මම කොහොමද ආපහු ගෙදර යන්නෙ...
ආපහු ගඟට ගිහින් වතුර ගේන්න ශක්තියක් එයාට තිබුනේ නෑ.. කුඩා මේරි සීතලේ අඬමින් එතනම ගුලිවුනා..
ඒ වෙලාවෙ එයා දැක්කා..
ගහ, කොළ, මල් කඳු හිමෙන් වැහිල තියෙන හැටි.. හිම තට්ටු මතට සඳ එළිය වැටිල දිලිසෙන හැටි.. කුඩා මේරි අහස දිහා බැලුවා....

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

නව වන කොටස

සැකසුම : තිළිණ අලහකෝන්

# දිවැසිවර එලියා

